ආයතනයේ නම : පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ

හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர் : நிர்வாகத்திற்கான பாராளுமன்ற ஆணையாளர் அலுவலகம் (ஓம்புட்ஸ்மன்)

பாராளுமன்றத்தில் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்டும் நடவடிக்கைகளுயும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Name of the Institution: Office of the Parliamentary Commissioner for Administration (Ombudsman)

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4).

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : **183**

ආයතනයේ නම : පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

| කමිටුව විසින් හඳුනාගෙන ඇති දුර්වලතා | දුර්වලතාවය නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය |
|---|---|
| <u>පළමු කොටස</u> | |
| 1. 2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ දී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂයේ දී මිලදී ගන්නා ලද හා අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි විද්‍යුත් තැපැල මගින් යොමු කර ඇත. |
| 2. 2016.03.31 දිනැති අංක 05/2016 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නැත. | 2020 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2021.11.05 දාතමින් යුක්තව ඉදිරිපත් කර ඇත. |
| 3. 2002.09.12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාව අප විසින් දින 150ක් ඇතුලත සකස් කර අවසන් කල ද, ඒ සඳහා ඇතුලත් කල යුතු විගණන විමසුම් වාර්තාව අදාල කාලය තුල නොලැබීම හේතුවෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය. කෙසේ වෙතත් 2022.08.24 දාතමින් යුක්තව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. |
| <u>දෙවන කොටස</u> | |
| 1. සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | ගිවිසුම් ගත වීමට තරම් දීර්ඝකාලීන පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම අපේක්ෂා නොකරන බැවින් දැනට සකස් කර නොමැති අතර, ඉදිරියේදී කාර්යසාධන ගිවිසුම් සකස් කිරීමට බලාපොරොත්තු වේ. |
| 2. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2020 වර්ෂයේ රට තුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් නිලධාරීන් පුහුණු වැඩමුළු වලට සහභාගීකරවීමට නොහැකි විය. |

(කේ. ටී. චිත්‍රසිරි)

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්

(ඔම්බුඩ්ස්මන්)